ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01.
இலங்கை
The Secretariat, Colombo 01
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: TTIP/01/2010 (1)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2012.02 .13

වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක: 01(2)/2010

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත,

**<u>සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම</u>**

රාජ්‍ය සේවයෙහි සහ රාජ්‍ය ව්‍යවසායන්හි සේවයේ නියුතු විධායක මට්ටමේ පරිපාලන, කළමනාකරණ නිලධාරීන් සහ වෘත්තීමය තනතුරුවල නිරතවන නිලධාරීන් සඳහා සහනදායී කොන්දේසිවලට යටත්ව මෝටර් රථ ආනයනය කිරීමට/ නව කොටස් සහ උපාංග යොදා දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථ මිළ දී ගැනීමට බලපත්‍ර ලබාදීම සඳහා වූ 2010.12.10 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2010 පහත පරිදි සංශෝධනය කෙරේ.

මේ යටතේ ඇති 01. (ආ), (ඉ), (ඊ) සහ (ඌ) වගන්ති ද 02.01 (ඇ) වගන්තිය ද 02.02 ද 03. (ආ) වගන්තිය සහ 04.(q) වගන්තිය ද පහත සඳහන් පරිදි සංශෝධනය කෙරෙනු ඇත.

01. යෝග්‍යතාව

01. (ආ) වසර හය (06) ක අඛණ්ඩ හා සක්‍රීය සේවා කාලයක් හිමි ත්‍රිවිධ හමුදාවන් හි ලුතිනන් කර්නල්, වින්ග් කමාන්ඩර්, කමාන්ඩර් හෝ ඊට ඉහළ තනතුරක ස්ථිර කර ඇති සහ ත්‍රිවිධ හමුදාවන් හි සේවය සඳහා බඳවාගැනීමෙන් පසු වසර හය (06) ක අඛණ්ඩ හා සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වෛද්‍යවරුන්, ගණකාධිකාරිවරුන්, ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥයින් හා නීතිඥවරුන් (හමුදා නිලය නොසලකා)

(ඉ) I. විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලවල වසර අට (08) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්

II. විශ්ව විද්‍යාල කුලපතිවරුන්

(ඊ) I. රාජ්‍ය ව්‍යවසායන්හි "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" තනතුරක වසර දොළහ (12) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ තනතුරෙහි ස්ථිර කර ඇති විධායක නිලධාරීන්

II. රාජ්‍ය ව්‍යවසායන්හි "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" විධායක තනතුරක වසර නවය (09) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අදාළ තනතුරෙහි ස්ථිර කරඇති වරලත් ඉංජිනේරුවරුන්, වරලත් ගණකාධිකාරීවරුන්, වරලත් වාස්තු විද්‍යාඥයින්,

(උ) රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා පත් කර ඇති වසර නවය (09) ක සක්‍රීය සේවා කාලයක් හිමි ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, වරලත් ඉංජිනේරුවරුන්, වරලත් ගණකාධිකාරීවරුන් හා වරලත් වාස්තු විද්‍යාඥයින්

## 02. කොන්දේසි, නියමයන් සහ සහන

### 02.01 කොන්දේසි සහ නියමයන්

(ඇ) I. ආනයනය/ මිළ දී ගැනීම කළ යුතු මෝටර් රථයේ උපරිම මි.ර.ගැ. වටිනාකම ඇ.එ.ජ. ඩොලර් 25,000 ක් හෝ ඒ හා සමාන අනෙකුත් විදේශ මුදල් ප්‍රමාණයක් විය යුතු අතර, ඒ සඳහා උපරිම එන්ජින් ධාරිතාවයක් අදාළ නොවේ. එසේ වුවද, අදාළ මෝටර් රථය සඳහා ගෙවිය යුතු බදු ප්‍රතිශතය නිර්ණය කිරීමේ දී ආනයනය කළ/ මිළ දී ගනු ලැබූ මෝටර් රථයේ එන්ජින් ධාරිතාවය පදනම් කර ගැනේ. ඒ අනුව, 02.02 වගුවෙහි දක්වා ඇති පරිදි බදු ගණනය කිරීම සිදු කරනු ලබයි. බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු මුළු බදු ප්‍රමාණයට ගැලපෙන පරිදි නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු හා රේගුබදු ගැලපීම් ශ්‍රී ලංකා රේගුව විසින් සිදු කරනු ලබයි.

**II. ආනයනය කරනු ලබන / මිළ දී ගනු ලබන මෝටර් රථයේ අනුමත මි.ර.ගැ. වටිනාකම, බදු සහන සහිතව ඇ.එ.ජ. ඩොලර් 5000ක් දක්වා පමණක් ඉක්මවා යා හැකි අතර, එසේ ඉක්මවා යන ඇ.එ.ජ. ඩොලර් 5000 සඳහා සහන බදු ප්‍රමාණයට අමතරව ආනයන තීරුබද්ද ද ගෙවිය යුතු වේ.**

III. 0102110 වක්‍රලේඛය යටතේ මෙතෙක් නිකුත් කරන 38 බලපත්‍ර සඳහා 3 ඉහත (ඇ) I සහ II අදාළ වේ.

### 02.02 බදු සහන

| වාහන වර්ගය සහ සිලින්ඩර ධාරිතාවය (පෙට්‍රල් / ඩීසල්) | රේගු වටිනාකම (CIF පදනම) මත ගෙවිය යුතු බදු ප්‍රතිශතය |
|---|---|
| 1000cc | 50 |
| 1600cc | 55 |
| 2000cc | 60 |
| 2600cc | 70 |
| 2600cc වැඩි පෙට්‍රල් / ඩීසල් | 80 |

03. ක්‍රියා පටිපාටිය

(ආ) අදාළ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර සඳහා, අදාළ අමාත්‍යාංශ ලේකම් / පළාත් සභා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශය පදනම් කරගෙන වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අදාළ අමාත්‍යාංශ ලේකම්ට, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට සහ අදාළ බැංකුවේ කළමනාකරුට පිටපත් සහිතව සහනදායී මෝටර් රථ ආනයන/ මිළ දී ගැනීමේ බලපත්‍රයක් නිකුත් කරනු ඇත.

04. අනෙකුත් කරුණු

(අ) මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පිළිබඳ අර්ථ නිරූපණය හා අවිනිශ්චිතතාවයන් පිළිබඳ ගැටළු ඇති වුවහොත්, ඒ පිළිබඳ පරීක්ෂා කර භාණ්ඩාගාරයේ ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් (පාලන) ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් වෙත යොමු කරනු ලබන අතර, ඒ නිර්දේශ මත හිමිකම් ලැබීම පිළිබඳ භාණ්ඩාගාරයේ ලේකම් ගේ තීරණය අවසන් තීරණය වන්නේය.

පී.බී. ජයසුන්දර
මහ භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
6. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව